**සිංහල භාෂාව හා සාහිත්‍ය III පත්‍රය**

**පිළිතුරු**

01. (I). (අ) බුදුන් වහන්සේ

(ආ) 18 යි

(II). (අ) කඩුල්ලේ තරම දැනගෙන කද බඳිනු

තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු

(ආ) ඇඹිල්ලේ තරමට ඉදිමෙන්න ඕන ලු

(III). (අ) සිංහබාහු සහ සිංහ සීවලි යන දෙදෙනාගේ

(ආ) රමෝන් , මැග්සෙසයි , ස්වර්ණ රජත , කුමාරන් අශාන්

(IV). (අ) බල - බලය

(ආ) බල - බලන්න

(V). (අ) අනුප්‍රාසය

(ආ) මුඬගර්ග - ගැබ් මුළා වූ

පණිවා - ප්‍රාණඝාතය

(VI). (අ) සියබස්ලකර

(ආ) සිව්වන සේන රජු

(VII). (අ) රැගෙන දෝතට පෙරා උණුහුමට හිරු එළිය

මිහිරි මවු කිරි වගේ පොවන්නෙමි නුඹලාට

(ආ) මිහිරි මවුකිරි වගේ

(VIII). (අ) චූලනි බ්‍රහ්මදත්ත රජු

(ආ) දර ගෙන්වීම නැවැත්වීම

(IX). (අ) සරේ ය - විල්වල

(ආ) සරේ ය - නාදය

(X). (අ) හේරත් ගේ

(ආ) වැසිකිළියක් පිළිබඳව

02. (I). (අ) උපතින් / උත්පත්තියෙන්

කැලයේ / වනාන්තරයේ / අරණේ

(ආ) තමාගේ පියා නරයෙකු නොව වනයෙහි දී හමු වූ සිංහ රාජයෙකු බව මවගෙන් දැන ගැනීම.

(II). (අ) ගැමියන්

* පැවරූ කාර්යය නිසි කළ ඉටු නොකිරීම
* වැසිකිළි භාවිතයට හුරුවීමට ඇති අකැමැත්ත

සෞඛ්‍ය පරීක්ෂක

* නිශ්චිත කාලය තුළ තම කාර්යය සොයා නොබැලීම
* තම රැකියාව ගැන පමණක් සිතා කටයුතු කිරීම

(ආ) * "එහෙමනම් අපට පෙරේතයො කොහොමට වත් පෙනෙන්නෙ නෑ නොවැ"

* " ඉතින් ඒ නොපෙනෙන සතා පෙනෙන දෙයක් කාපුවහම ඒ කාපු දේවත් පේන්ට එපා යෑ"

(III). (අ) "ණය නැති බිය නැති නිවහල් යුගයක

පුංචි පුතා රජ කරනු පෙනේ"

(ආ) " ඔබහට ලෝකය ඉදි කර දී මිස

යා නොහැකිය මට පුංචි පුතුන්"

(IV). (අ) උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය

(ආ) උත්ප්‍රේක්ෂාලංකාරය , අනුප්‍රාසය

(V). (අ) තෙල ලෙසින් - මේ අයුරින් / ඒ අයුරින්

සී පී සේක - සිනා සුණු සේක / සිනාසුණහ

03. (I).

* " සිත නොම සැන සේ හිඳිනට මෙලෙසේ
දිවි හිමියෙන් මෙලෙනේ
බොහො ආදර ඇති මුත් ම පියා අපහට
පල නැත මෙ දිවියෙනේ "

* " ........................
රාජකතා කී විසිතුරු
දැන් සිහිවන්නේ
සැප සයනා සුවඳ බොජුන්
තුමුල මාලිගා
ඇ සම්පත් හැරදා ඇයි
මෙලෙස වෙසෙන්නේ"

* " ............

කුමක්දෝ මේ පාපේ ලෙනේ මේ විසීමේ සෙතක් දෝ

යන්ට දැන්නම් කාලෙ වේ

මැණියන් හා නැගනි සමගින්

උරුමෙ අපගේ සොයමිනා.....

* " මැණියනි කිව ඔබ බස් අසා

සනිටුහන් කර ගතිමි

නොපමාව යා යුතු ය

මේ ලෙනෙන් ඔබ දෙදෙන

මා සමග යා යුතු ය ...."

* " ඔබ දෙදෙන මා සමග

නො ආවොත් යන්ට වේ

ඔබ දමා මේ ලෙනේ

මට උරුම වූ දිවිය

මා සොයා යා යුතුය

....................

සපල කර ගත නොහැකි

ජීවිතේ මේ ලෙසේ"

නොපෙනෙන කලටා සැරසෙනු කුමටා

මා දැන් වළකන්ටා....."

* පටහැනි වෙන්ටා නොව ඔහු අණටා

වෙන මහ ගැලවෙන්ටා

නොපෙනන කලටා සැරසෙනු කුමටා

මා දැන් වළකන්ටා"

(II).

* " මා පියා හැර දමා
යන්නෙ අප කෙලෙස දෝ
වලට ගොස් විඩා වී
පැමිණි විට නැත කෙනෙක්
අහර පිස දෙන්ටා
හුදෙකලා මේ ලෙනේ
ඉන්නෙ ඔහු කෙලෙස දෝ
නැද්ද වෙත පියාණන්
ආදරේ ඔබ හදේ
මෙවන් දේ කියන්ටා
සොහොයුරනි පෙම්බරා"

* " කෙසේ හෝ යා නොහැක
ඇතේ තර කර වසා
දොර ලෙනේ මහ ගලින
පියතුමගෙ රූදු තුමුල
බාහු යුවළින් ම මීස
බැරිය සොලවන්ට එය
යන්ට නොසිතන්ට මා
සොහොයුරනි පෙම්බරා"

**නැතහොත්**

(I). * දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය.
* නොයෙක් තැනම පිපි මල් පිරුණු පොකුණුය.
* නුදුරුව සිහිලැ 'ලී ගඟුලැ' ලී ය.
* පවන'ද පිපි තුරේ ය නිරතුරේ ය.

(II). * සාර පලය අඹ දඹ රඹ ද වල් පිට
* කුලින් කුළම සිහිලඹ වැහෙන කඳුරුය
* පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
* දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතු ය. ආදී කවි.

04. (I). * සියලුම රාජ්‍යයන්හි සිදුවන කටයුතු පිළිබඳ දැන ගෙන ඒම පිණිස ගිරා පෝතකයා යැවීම.

* රජ දරුවන් සියයක් හා තවත් බොහෝ පිරිස මැරීමට සූදානම් කර තිබූ මධු පාන උත්සවය විධ්වසනය කිරීම.

* කේවට්ටයාගේ සියලු උපායන් ඉදිරියේ ඉතා පහසුවෙන් ඊට ප්‍රතිචාර දක්වමින් ඔහුගේ හැකියාවන්ට අභියෝග කිරීම.

(II). * තමාගේ පුද්ගලික අභිමතාර්ථ නැතහොත් ආත්මාර්ථ සාධනයෙහි ලා චූලනි බ්‍රහ්මදත්ත රජු මෙහෙයවීම.

* පටු අවශ්‍යතා වෙනුවෙන් රජදරුවන් හා තවත් පිරිස ඝාතනය කිරීමට සැලැස් වීම.

* එක් එක් උත්සාහයන් පරාජය වුවත් සැමවිට ම තම පටු අරමුණු ජය ගැනීමට ප්‍රයන්ත දැරීම.

**නැතහොත්**

(I). * ප්‍රිය සාදය සඳහා ආරාධනා පත්‍රයක් ලබාගෙන එය තම බිරිඳට සතුටින් භාර දීම.

* තමා ඉතා අසීරුවෙන් ආරක්ෂා කර සිටි ප්‍රෑන්කු 400ක මුදල ඇඳුමක් සඳහා ලබාදීම.

* තම බිරිඳට උත්සවය අවස්ථාවේ ඕනෑ තරම් සතුටු වීමට අවස්ථාව ලබා දී තමා වෙන් ව සිටීම.

* ප්‍රීති සාදය නිම වූ පසු ඔහු ගෙන ආ බ්ලැන්කේට්ටුව ඇයට පැලඳ වීම.

* නැති වූ මාලය පිළිබඳ ව වචනයකින්වත් බිරිඳට චෝදනා නොකර නැවත එම මාලය සෙවීමට පයින්ම ගමන් කිරීම.

* නැවත වෙනත් මාලයක් සොයමින් විවිධ ස්ථානවලට යාම. (පැලේ , රෝයල් වීථියේ පිහිටි සාප්පු වෙත යාම.)

(II). * තමාට තරම් නොවූ විවාහයක් කරගත් බව සිතමින් අසතුටින් සිටීම.

* විශාල මාලිගා සිතින් මවා ගනිමින් , මනස්තාපයෙන් , පශ්චාත්තාපයෙන් කල් ගෙවීම.

* මහාර්ඝ තිරරෙදි ,උස් ලෝකඩ පහන් , ගිනි උඳුන් , සරුවාල ඇඳගත් සේවකයන් , අන්තර් ගර්භභාර ආදි සිතින් මවාගත් පහසුකම්.

* උත්සවයට සහභාගී වී තමා කරා ගලා ආ ආශ්චර්යවත් ආහ්ලාදයන් හා බහුමානයන්ගෙන් ද අතිමහත් සතුටට පත් වීම.

* තම රූප සෞන්දර්ය පිළිබඳ ආනන්දයෙන් සිටිම.

05. විවාහ ජීවිතය සඳහා .............

* එක්වුණදාට උක් දණ්ඩේ පැණි සේමා

* අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා

* රන් විමනේ සිටිමුන් දුක නැති වෙද්ද

සාමාන්‍ය ජීවිතය සඳහා.............

*ගසට කෙටු ගස මුල පැයුමෙන් දැනේ

* නහින දෙහින කාලෙට පින් කෙරුම යුත

* වරද පෙනෙන තරමට වැරදුණා නොවේ

* ගොඩැල්ලෙ තරම දැනගෙන ළිඳ කපනු

* ඇස නැතිදා පොත ගත්තේ කියන්ට ද

06. * ආරම්භයේ දී ම කතෘ සාරය ඉදිරිපත් කිරීම.

* සංවාදාත්මකව කතාව ඉදිරිපත් කිරීම.

* සෑම චරිතයක් සඳහා ම ගෞරවාර්ථ නාම භාවිතා කිරීම.

උදා -: පුත ,විද්දතාණෙනි , දුවනියන් , පුත්‍රයාණන්

* උපමා භාවිතය

- "අවකාශයෙන් සැදු හසුරුන ඇදි ඇදි සේ දුවන්නා සේ"

- "පැසුණු ගොයම් මුල් වූවා සේ .."

* අවශ්‍ය පරිදි ගාථාපාඨ යොදා ගැනීම.

උදා-: " ඉඩස පස්ස නටපුත්ත උග්ගසේන මහබ්බල"

* ධර්මාවවාදයක් ලබා දීම.

"තුන්දුසිරිත් දුරුව තුන් සුසිර පුරා මතු මතුයෙහි ලැබිය යුතු ලොව් ලොවුතුරා ගුණ විශේෂයට පිහිට විය යුතුය."

* "මේ සිත තබා , අනුන්ට හෙළා පිරිහෙළා කීමෙන් දුරුවිය යුතු"

* කතාවත් බණත් එක්වර ම ඉදිරිපත් කිරීම.

* අවස්ථානුකූලව කෙටි වැකි යොදා ගැනීම.

උදා-: " ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමි"

උඩ අහස සක්මදුන් කෙරෙයි , නටයි , ගීත් කියයි.

07. " කඳු බෑවුමක දං බෝවිටි පඳුරු තළා............."

කුඩා දියපහරක් ලෙසින් ඇරඹෙන ගංගාව මෙන් ම ජීවිතයේ ද ආරම්භය සිදුවන අයුරු

* " සැහවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි "

ජීවිතයේ මුණ ගැසෙන විවිධ අවස්ථා ඒවාට ඍජුව මුහුණ දෙන ආකාරය ජීවිතයේ යෞවන කාලය මෙහි වර්ණයට හසුව ඇත.

* "මී අඹ - කිරල -මාදම් ගෙඩි ළඳරු වියෙ"

ජීවිතයේ විවිධ අවස්ථා පිළිබඳ ව පැවසේ. සොඳුරු රසවත් මෙන් ම කර්කශ අමිහිරි අවස්ථාවන් ද ජීවිතයේ හමු වන අයුරු දක්වයි.

* " හිරිමල් සිනා රැළි පෙණ පිඩු මිහිරිතම"